NCAS

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS)

13 වන වාර්ෂික වාර්තාව

2017

දැක්ම

"මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ෂේත්‍ර තුළ දැනුම,සම්පත්,පර්යේෂණ , අධ්‍යාපනය සහ සමාජ ක්‍රියාකාරකම් අතර සහක්‍රියා ගොඩනගමින්, විශිෂ්ඨත්වය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර කීර්තිය ලත් මධ්‍යස්ථානයක් බවට පත් වීම."

මෙහෙවර

"සියලු ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාලවල ඉගැන්වීම් සහ පර්යේෂණ ශක්තිමත් කිරීමට සහ වැඩි දියුණු කිරීමට ඇති අවශ්‍යතාවය හඳුනා ගනිමින්, පර්යේෂණ හා ප්‍රතිපත්ති දායකත්වය හරහා රටෙහි සහ සමාජයෙහි සංවර්ධනයට විශ්වවිද්‍යාල දායක විය යුතු බව අවබෝධ කර ගනිමින්, NACS සෛද්ධාන්තික සහ ව්‍යවහාරික දෙයාකාරයෙන්ම මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ෂේත්‍රය තුළ පශ්චාත් උපාධිමය, පශ්චාත් -ආචාර්ය උපාධිමය සහ වෙනත් පර්යේෂණවලට සහාය දැක්විය යුතු අතර එම දිශාව දෙසට විද්වතුන් අභිප්‍රේරණය කරමින් සහ ප්‍රතිලාභ ලබා දෙමින් උසස් චින්තනය සහ නිර්මානාත්මක නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය කළ යුතුය. NCAS එහි පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමට ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමඟ ජාල ගත වෙමින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල තුළ අග්‍ර මණ්ඩලයක් වනු ඇත."

පෙරවදන

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ වගන්තිය ප්‍රකාරව 2005 අංක 2 දරන ආඥා පනත යටතේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS) පිහිටුවන ලද අතර එය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්ට අදාළ පර්යේෂණ හා බුද්ධිමය ක්‍රියාකාරකම් සඳහා වන නිවහන වේ. එය විද්වතුන් අතර පරිකල්පනීය චින්තනය, නවෝත්පාදනය, නිර්මාණශීලීත්වය හා මුල් සොයා ගැනීම් ප්‍රවර්ධනය කරයි.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමුඛතම ප්‍රදාන පිරිනැමුම් ආයතනය ලෙස මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය මේ වන විට දේශීය හා විදේශීය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විද්වතුන් 478 දෙනෙකුට මූල්‍ය ආධාර ලබා දී ඇත. මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය මඟින් විද්වතුන්ට ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීමට, පර්යේෂණ ක්‍රමවේදයන්, සංඛ්‍යානමය විශ්ලේෂණයන් සහ අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳව අඛණ්ඩ පුහුණුව ලබා දෙයි. NCAS 2013 වර්ෂයේ සිට, පරිපාලන කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලට පුහුණුව ලබා දීම සඳහා සිදු කරන ක්‍රියාකාරකම් පුළුල් කර ඇත. ඒ අනුව විශ්වවිද්‍යාලවල අධ්‍යයන හැකියාවන්, පරිපාලන හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු කිහිපයක් පවත්වනු ලැබීය. සංඛ්‍යාන විශ්ලේෂණ පාඨමාලා (SPSS, AMOS ආදිය), ව්‍යාපාර හා පරිපාලනමය රචනය, අධ්‍යයන රචනය, පරිගණක මෘදුකාංග පාඨමාලා (මයික්‍රොසොෆ්ට් එක්සෙල් ආදිය) 2017 වර්ෂයේ දී පවත්වන ලද ප්‍රධාන පාඨමාලා වේ.

විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් ඉතා සාර්ථක වූ අතර බොහෝ අධ්‍යයන කාර්ය මණ්ඩල සහ පර්යේෂණ, පරිපාලන කාර්ය මණ්ඩල සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල එයින් ප්‍රතිලාභ ලැබීය. මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වනුයේ කලා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨවල පශ්චාත් උපාධි අපේක්ෂකයින් සඳහා විද්‍යාත්මක මූලධර්ම මත පදනම්ව ඔවුන්ගේ පර්යේෂණ කුසලතා වර්ධනය කර ගැනීමට පුහුණුව සැපයීමයි. සහභාගීවන්නන්ගේ න්‍යායාත්මක හා ආනුභූතික පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් විද්වත් මණ්ඩලයක් විසින් මෙම පුළුල් පාඨමාලා පවත්වනු ලබයි. දේශන සිදු කිරීමේ දී ආචාර්යවරුන් විද්‍යුත් ඉගෙනුම් සම්පත් සහ මෘදුකාංග යෙදුම් යොදා ගනු ලබයි. පශ්චාත් උපාධි අපේක්ෂකයින් සඳහා සංඛ්‍යානමය පුහුණුව ලබා දීම සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙ හි ස්ථාපිත පරිගණක විද්‍යාගාරය භාවිතා කරන ලදී. NCAS විසින් එහි වෙබ් අඩවිය හරහා පර්යේෂකයන්ට විද්‍යුත් පුස්තකාල සම්පත් පහසුකම් ද සපයනු ලබයි. 2017 දෙසැම්බර් 20 වන දින කොළඹ හිල්ටන් රෙසිඩන්සස් (ජයික් හිල්ටන්) හි පවත්වන ලද 4 වන වාර්ෂික පර්යේෂණ පරිසංවාදය, NCAS විසින් 2017 වර්ෂයේ දී සාර්ථකව ක්‍රියාත්මක කරන ලද වැඩසටහනක් ලෙස පෙන්වා දිය හැකිය. සමාරම්භක සැසිය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා සහභාගී වූ අතර නව දිල්ලි, දකුණු ආසියාතික විශ්වවිද්‍යාලයේ උප සභාපති මහාචාර්ය සසංක පෙරේරා මහතා **"සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර ප්‍රතිස්ථාපනය කිරීම: දකුණු ආසියාවේ සටහන්"** යන මාතෘකාව ඔස්සේ සමාරම්භක සැසියේ ප්‍රධාන දේශනය පවත්වනු ලැබීය. පර්යේෂණ පත්‍රිකා කැඳවමින් පළකළ දැන්වීමට ප්‍රතිචාර වශයෙන් NCAS වෙත පර්යේෂණ පත්‍රිකා 96ක් (විස්තෘත පර්යේෂණ සාරාංශ) ලැබුණි. එම පර්යේෂණ පත්‍රිකා අතරින් පර්යේෂණ පත්‍රිකා 62ක් මෙම සම්මන්ත්‍රණයට මුලින්ම තෝරා ගන්නා ලදි. කෙසේ වෙතත්, මෙම පරිසංවාදය සඳහා සම-කතුවරුන් ඇතුළුව කතුවරුන් 59දෙනෙක් ලියාපදිංචි වූහ. තෝරා ගත් සංඛ්‍යාවෙන්, පර්යේෂණ පත්‍රිකා 48ක් අදාළ කතුවරුන් විසින් සමාන්තර කාණ්ඩ 4 තුළ ඉදිරිපත් කරන ලදි. මෙම සංයුක්ත සැලැස්ම තුළ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන අංශයේ කේන්ද්‍රස්ථානයක් ලෙස අපි NCAS අඛණ්ඩව සංවර්ධනය කරමු.

මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න
අධ්‍යක්ෂ

පටුන

ආයතනික තොරතුරු	4
හැඳින්වීම	5
කළමනාකරණය	6-15
NCAS හි කාර්ය මණ්ඩලය	16-17
වැඩමුළු/පාඨමාලා/ඉදිරිපත් කිරීම්	18-22
තොරතුරු තාක්ෂණ සම්පත්	23
ශිෂ්‍යත්ව වැඩසටහන්	24-41
පුස්තකාල/විද්‍යුත් සම්පත්	41
විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව	42
මූල්‍ය වාර්තාව	43-59
විගණකාධිපති වාර්තාව	60 - 68

අධ්‍යක්ෂ
මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
එච්.පී. හේනේගම මිය
පී.පී.වික්‍රමාරච්චි මිය

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
ජේ.ටී.එල්.ධර්මසේන මිය
ඒ.ඒ.එස්.වින්තානි මිය

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ 2005 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය
අංක 6A, සුකස්තාන් ගාඩන්ස්,
වෝඩ් පෙදෙස,
කොළඹ 07
ශ්‍රී ලංකා

දුරකථන : 94-11-2685850, 2693974
ෆැක්ස් : 94-11-2693975
ඊ-මේල් : info@ncas.ac.lk
වෙබ් : www.ncas.ac.lk

ආයතනික තොරතුරු

ආයතනයේ නම	:	මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය
ලියාපදිංචි කාර්යාලය	:	අංක 6A, සුකස්තාන් ගාඩන්ස්, වෝඩ් පෙදෙස, කොළඹ 07.
සංයුතිය සහ නීතිමය ආකෘතිය	:	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ 2005 අගෝස්තු ආඥා පනත යටතේ නෛතිකව පිහිටුවන ලද රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.
අරමුදල් ප්‍රභවය	:	මහා භාණ්ඩාගාර අරමුදල්
මූල්‍ය කාලපරිච්ඡේදය	:	2017 ජනවාරි 01 සිට 2017 දෙසැම්බර් 31 දක්වා
අධ්‍යක්ෂ	:	මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න
විගණක	:	විගණකාධිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව අභ්‍යන්තර විගණක, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
බැංකුකරු	:	ලංකා බැංකුව, ටොරින්ටන් ශාඛාව
ඇමතුම් තොරතුරු	:	දුරකථන : **94-11-2685850, 2693974** ෆැක්ස් : **94-11-2693975** ඊ-මේල් : **info@ncas.ac.lk** වෙබ් : **www.ncas.ac.lk**

හැඳින්වීම

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේවූ 2005 අංක 2 දරන ආඥා පනත යටතේ නෛතිකව පිහිටුවන ලද අතර 2005 ඔක්තෝබර් 19 දිනැති අංක 1415/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී. ඉන් අනතුරුව 2008 සැප්තැම්බර් මස 15 දිනැති අංක 1567 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කළ 2008 අංක 03 දරන මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (සංශෝධනය කිරීමේ) ආඥා පනත මඟින් සංශෝධනය කරන ලදී.

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය මූලිකවම පිහිටුවනු ලැබුවේ ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර යන ක්ෂේත්‍රවල සේවය කරන අධ්‍යයන ප්‍රජාවේ අවශ්‍යතාවන් ඉටු කිරීම පිණිසය. මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතා සහ අදාළ ක්ෂේත්‍රවල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු කීපදෙනෙක් විසින් එය ආරම්භ කරන ලදී. කඩිනමින් ව්‍යාප්ත වන ජාතික විශ්වවිද්‍යාල පද්ධතියේ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර අංශවල අධ්‍යයන අවශ්‍යතාවන් ඉටු කිරීම පිණිස දැනට ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාලවලින් බැහැර ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාව මතුවිය. සුදුසුකම් අත්කර ගන්නා සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂා කරන ශිෂ්‍යයින්ගේ සංඛ්‍යාවේ වර්ධනයට ප්‍රතිචාර වශයෙන් ප්‍රතිපත්ති වෙනස් කිරීම සමඟ 1970 දශකයේ අග භාගයේ සිට දිවයිනේ පළාත් කීපයකම නව විශ්වවිද්‍යාල රාශියක් විවෘත කරන ලදී. මෙම නව ආයතනවල පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කළ කාර්ය මණ්ඩල අවශ්‍යතාවන් සපුරාලූයේ පිහිටුවා තිබූ විශ්වවිද්‍යාල හරහාය. අධ්‍යයන ප්‍රජාව හිඟවීම සහ සාර්ථක විශ්වවිද්‍යාලවල පවා ශික්ෂණය දුර්වලවීම මෙහි අවසාන ප්‍රතිඵලය විය. අලුතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාලවලට අත්දැකීම් බහුල හා සුදුසුකම්ලත් කථිකාචාර්යවරු අඩු වන අතර පර්යේෂණ හා උසස් අධ්‍යාපන කටයුතු කිරීම සඳහා වූ පහසුකම් ද අවම වේ. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා යන ක්ෂේත්‍රවල බඳවාගත් නවක නිලධාරීන්ට පශ්චාත්-උපාධි අධ්‍යයන සිදු කිරීමට දිරිගැන්වීම හරහා පුහුණු කිරීම නව විශ්වවිද්‍යාල පිහිටුවීම සමඟ ඇති වූ රික්තය පිරවීම පිණිස ගත් පියවරකි. මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය තරුණ ගුරුවරුන්ට පර්යේෂණ ක්‍රමවේද, යෝජනා ගොඩනැගීම, පර්යේෂණ සඳහා අවශ්‍ය කරන සංඛ්‍යාලේඛන හා අධ්‍යයන රචනා සඳහා අවශ්‍ය කරන ලේඛන නිපුණතා ආදිය පිළිබඳව දැනුවත් කිරීම හරහා ඔවුන් පශ්චාත්-උපාධි අධ්‍යයන කටයුතුවලට සූදානම් කිරීම සඳහා උපකාරී විය.

මානව සම්පත් සංවර්ධනය සහ උසස් පර්යේෂණාත්මක අධ්‍යයන කටයුතු සඳහා 2017 වසර අවසාන වන විට ශාස්ත්‍රඥයින් 483 දෙනෙක් සඳහා ඔවුන්ගේ දේශීය හා විදේශීය අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා රාජ්‍ය අරමුදල් මඟින් මූල්‍යාධාර ලබා දෙන ලදි. මේ වන විට මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල පද්ධතියේ විශාලතම මානව සම්පත් සංවර්ධන වැඩසටහන බවට පත්ව ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 අගෝස්තු 15 දින මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ/උප සභාපති මහාචාර්ය පී.එස්.එම්.ගුණරත්න මහතාව පත් කරන ලදි. මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය ඔහුගේ නායකත්වය යටතේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ඔවුන්ගේ පර්යේෂණ හැකියාව ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් නව පුහුණු වැඩසටහන් මාලාවක් ආරම්භ කරන ලදී. මෙම පුහුණු වැඩසටහන් හඳුන්වාදීමේ ප්‍රධානතම අරමුණ වූයේ Nvivo / AMOS / Eviews වැනි නවීන මෘදුකාංග භාවිතා කරමින් සමාජ විද්‍යා පර්යේෂණවල ගුණාත්මක පර්යේෂණ පැතිකඩ සංවර්ධනය කිරීමයි.

තවද, NCAS විසින් මීට පෙර ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන්/ පර්යේෂණ යෝජනා සංවර්ධනය පිළිබඳ වැඩමුළු, සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රමවේදයන් සහ SPSS භාවිතා කරමින් සංඛ්‍යාන විශ්ලේෂණ තව දුරටත් අඛණ්ඩව පවත්වන ලදි. එම අවස්ථාවන් පිළිබඳ විස්තරයන් වෙන් වෙන් වශයෙන් දැක්වේ. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උසස් වීම්,පර්යේෂණ සංවර්ධන සහ උසස් අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය විසින් සමාලෝචිත වර්ෂය තුළ දී සිදු කරන ලද ක්‍රියාකාරකම්වල යහපත් ප්‍රතිලාභ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්ට පමණක් සීමා නොවූ අතර අනෙකුත් අදාළ ක්ෂේත්‍රයන්ට ද ඉන් ප්‍රතිලාභ සැලසුණි.

සමාලෝචිත වර්ෂය තුළ, NCAS ප්‍රදානලාභීන්ට ඔවුන්ගේ පර්යේෂණ සොයා ගැනීම් ඉදිරිපත් කිරීමටත්, ප්‍රකාශයට පත් කිරීමටත් අවස්ථාවක් උදාකර දීමේ අරමුණින්, 2017 වර්ෂයේ දෙසැම්බර් මස 20 වැනි දින

කොළඹ හිල්ටන් රෙසිඩන්සීස්හි දී සිව්වන වාර්ෂික පර්යේෂණ පරිසංවාදය NCAS විසින් සාර්ථකව පවත්වන ලදි.

<u>කළමනාකරණය</u>

<u>ව්‍යුහයන්/ රැස්වීම්</u>

2008 සැප්තැම්බර් මස 15 දිනැති අංක 1567 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කළ 2008 අංක 03 දරන මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (සංශෝධනය කිරීමේ) ආඥා පනත අනුව පාලක සභාව සහ කළමනාකරණ සභාව පහත දැක්වෙන පරිදි සංයුක්ත වේ:-

<u>පාලක සභාව සහ කළමනාකරණ සභාව</u>

මධ්‍යස්ථානයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදක හා පාලන අධිකාරිය වන පාලක කවුන්සලය වසරකට අවම වශයෙන් දෙවරක් රැස් වේ.

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙ හි පරිපාලන හා අධ්‍යයන අධිකාරිය වන කළමනාකරණ සභාව, වසර තුළ දී විධිමත් රැස්වීම් හතක් පවත්වන ලදී.

කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය පහත දැක්වේ: -

මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න අධ්‍යක්ෂ/ NCAS සභාපති/ COM (2015 අගෝස්තු 15 සිට)	මහාචාර්ය පී. එස්. එම්. ගුණරත්න, මුදල් පිළිබඳ මහාචාර්ය, අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රමුඛ ජාතික සංවිධාන රාශියක කීර්තිමත් තනතුරු දරා ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප-සභාපති ධූරය භාරගැනීමට පෙර මහාචාර්ය ගුණරත්න කොළඹ විශ්වවිද්‍යාලයේ වාණිජ අධ්‍යයන අංශයේ ප්‍රධානියා, කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පශ්චාත්-උපාධි හා මැදි-වෘත්තීය සංවර්ධන ඒකකයේ සම්බන්ධීකාරක, කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පීඨාධිපති, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසැලේ පාලක මණ්ඩලයේ සාමාජික, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනයේ (NIBM) පාලක මණ්ඩලයේ සාමාජික, ජාතික අධ්‍යාපන ආයතනයේ (NIE) පාලක මණ්ඩලයේ සාමාජික, ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) පශ්චාත්-අධ්‍යාපන පාසැලේ අධ්‍යයන කටයුතු පිළිබඳ මණ්ඩලයේ සාමාජික ලෙස සේවය කර ඇත. මහාචාර්ය ගුණරත්න මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගෙන ඇත. ජපාන රජයෙන් පිරිනමන කීර්තිමත් 'MONBUKAGAkAGAKUSHO ශිෂ්‍යත්වය දිනා ගත් ඒ මහතා ඒ අනුව ජපානයේ සුකුබා විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය පිළිබඳ විද්‍යාපති උපාධිය සහ දර්ශනපති උපාධිය සම්පූර්ණ කරන ලදී. (එක්සත් රාජධානියේ) පොදු රාජ්‍ය මණ්ඩලීය පශ්චාත්-ආචාර්ය උපාධි ශිෂ්‍යත්වය දිනා ගත් මහාචාර්ය ගුණරත්න මහතා (එක්සත් රාජධානියේ) මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයේ සංවර්ධන මූල්‍ය පිළිබඳ ආයතනයේ බාහිර කථිකාචාර්යවරයෙක් විය. තව ද විද්‍යාව ප්‍රවර්ධනය සඳහා වූ ජපන් සමිතියේ (JSPS) ශිෂ්‍යත්වලාභියෙක් ද වන මහාචාර්ය ගුණරත්න මහතා ජපානයේ යොකොහාමා ජාතික විශ්වවිද්‍යාලයේ බාහිර පර්යේෂණ සාමාජිකයෙක් ලෙස ද සේවය කළේය.

මහාචාර්ය ජේ.ඒ.එස්.කේ ජයකොඩි (2015 ජුනි 19 සිට)	මහාචාර්ය ජේ. ඒ. එස්. කේ. ජයකොඩි මහතා NCAS ප්‍රතිපාදන මත ශ්‍රී ලංකා කළමනාකරණය පිළිබඳ පශ්චාත්-උපාධි ආයතනයේ ආචාර්ය ට්‍රාවිස් පෙරේරා මහතාගේ සහ ඉන්දියාවේ කළමනාකරණය පිළිබඳ ග්‍රේට් ලේක්ස් ආයතනයේ මහාචාර්ය වෙන්කට් ආර්. ක්‍රිශ්නන් මහතාගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත්-උපාධි ආයතනයෙන් සිය ආචාර්ය උපාධිය සම්පූර්ණ කරන ලදී. ඔහුගේ පර්යේෂණ අධ්‍යයනය නායකත්ව සාහිත්‍යය තුළ ජනකාන්තභාව ආකාරිකරණ ගැටළුව ලෙස හඳුන්වන වෙනස්කම් හඳුන්වා දුන් හා ඒවාට නායකත්වය දුන් කාරකයින්ගේ නික්මයාමත් සමඟ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සංවිධානවල වෙනස්කම් මූලාරම්භයන් ගිලිහී යන්නේ ඇයි යන ප්‍රශ්නයට පිළිතුරු සෙවීමට උත්සාහ කරයි. නායකයා විසින් අනුගාමිකයාගේ ස්වයං-විෂමතාවන් ප්‍රේරණය කරන තෙක් සහ ඒ අනුව අනුගාමිකයාගේ පුද්ගලික අනන්‍යතාව නිර්මාණය කරන තෙක් අනුගාමිකයා ස්වයං-කැපකිරීම්, අතිරේක වෙහෙසක් දරනු ලබන අතර නායකයා මත රැඳී සිටීමේ නැඹුරුවක් දක්වන බවත් එබැවින් නායකයාගේ වෑයම අඛණ්ඩව ගතික වේය යන්න ඔහුගේ ප්‍රස්තුතය විය.මෙහි ප්‍රතිඵලයක් ලෙස නායකයාගේ නික්මයාම හෝ වෙනත් ආකාරයකින් ජනකාන්තභාවය නැති වී යන විට සහ ඒ අනුව නිර්මාණය වූ ස්වයං-විෂමතාවන් ක්ෂය වන විට අනුගාමිකයාගේ පුද්ගලික අනන්‍යතාව දුර්වල වන අතර අනුගාමිකයා ඔහුගේ/ ඇගේ කැපවීම, අතිරේක වෙහෙස හා පරායත්තාව ඉවත් කර ගන්නා අතර එබැවින් නායකයාගේ වෑයමේ ගතිකත්වය දුර්වල වේ. මෙම ප්‍රස්තුතය, පොදුවේ ගත් කළ, ප්‍රත්‍යක්ෂ මූලිකව සනාථ කරනු ලැබේ.
ආචාර්ය ඩී.පී.එස්. චන්ද්‍රකුමාර (2016 අගෝස්තු 16 සිට)	ආචාර්ය ඩී.පී.එස් චන්ද්‍රකුමාර මහතා 1986 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය ලබා ගත්තේය. ඔහු 1993 වසරේදී ඉන්දියාවේ කේරල සරසවියෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා ගෙන ස්වීඩනයේ උප්සලා .සහ ගොතෙන්බර්ග් විශ්වවිද්‍යාලවල පුහුණුව ලැබීමෙන් පසුව ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලබාගත්තේය.වර්තමානයේ ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති ලෙස කටයුතු කරයි. ආචාර්ය චන්ද්‍රකුමාර මහතා ස්වීඩනයේ ගොතෙන්බර්ග් සහ උප්සලා විශ්වවිද්‍යාලවල, ඇමරිකාවේ ඩියුක් විශ්වවිද්‍යාලයේ පාරිසරික හා පෘථිවි විද්‍යා පිළිබඳ නිකොලස් විද්‍යායතනයේ, ජපානයේ නගෝයා විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ උපාධි විද්‍යායතනයේ හා ඕස්ට්‍රේලියාවේ මොනාෂ් විශ්වවිද්‍යාලයේ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ විවිධ පර්යේෂණ හා අධි ශිෂ්‍යත්ව වැඩසටහන් යටතේ පුහුණුව ලැබීය.ඔහු විශේෂයෙන්ම සංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීමේ ගැටළු පිළිබඳ කැපී පෙනෙන පර්යේෂකයෙකි.මීට අමතරව, සරසවි සිසුන්ගේ සිට ආචාර්ය උපාධියහදාරන සිසුන් දක්වා අදාළ ව්‍යවහාරික පර්යේෂණ හා පර්යේෂණ ක්‍රමවේද ඉගැන්වීමෙහි ඔහු නිරත වී ඇත.
මහාචාර්ය අයි.එම්.කේ. ලියනගේ (2016 අප්‍රේල් 01 සිට)	කමලා ලියනගේ මහත්මිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයේ සේවය කරන ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරියකි (ශාස්ත්‍රවේදී, ගෞරව, ශාස්ත්‍රපති - පේරාදෙණිය සහ ආචාර උපාධිය, කියෝ ටෝකියේ). පර්යේෂණ අධ්‍යයන 25කට අධික සංඛ්‍යාවක් සාර්ථකව නිමා කර ඇති ඇය ග්‍රන්ථ, සංස්කරණය කළ කෘතිවල පරිච්ඡේද, ප්‍රධාන වශයෙන්ම දේශපාලන

	විද්‍යාව, පුමතිරිභාවය පිළිබඳ ගැටළු හා අධ්‍යාපනය පිළිබඳ නිර්දේශ කළ හා නොකළ වාරසඟරාවල ලිපි හා ශාස්ත්‍රීය නිබන්ධන ප්‍රකාශයට පත් කර ඇත. ඇය මොන්බුෂෝ ශිෂ්‍යත්වය (1985 - ටෝකියෝ විශ්වවිද්‍යාලය), රොටරි යොනෙයාමා ශිෂ්‍යත්වය (1988 - කියෝ විශ්වවිද්‍යාලය), කොබයෂි සෙට්සුටාරෝ අනුස්මරණ ශිෂ්‍යත්වය (1989), ග්‍රාමීය ආසියානු සහයෝගීතා පදනම් ශිෂ්‍යත්වය (1989), ටකාකු ශිෂ්‍යත්වය (1989), ෆුකුසාවා යුකිචි ශිෂ්‍යත්වය (1990), සංවර්ධනය වෙමින් පවතින ආර්ථික ආයතනයේ ශිෂ්‍යත්වය - ටෝකියෝ (1997), පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්වය (1998 - ලන්ඩන් විශ්වවිද්‍යාලය), ෆුල්බ්‍රයිට් ශිෂ්‍යත්වය (2004 - ඇමෙරිකානු විශ්වවිද්‍යාලය, වොෂින්ටන් ඩී.සී.), ජපාන පදනම් ශිෂ්‍යත්වය (2013) යන ඉතා කීර්තිමත් ශිෂ්‍යත්ව රාශියක්ම දිනා ගැනීමට සමත් වී ඇති අතර ශික්ෂණය, පර්යේෂණ හා විශ්වවිද්‍යාල පරිපාලනය යන අංශවල ජාතික හා අන්තර්ජාතික අත්දැකීම් රාශියක් ලබා ඇත.
මහාචාර්ය සමන්ති සේනාරත්න (2015 ජුනි 19 සිට)	සමන්ති සේනාරත්න මහත්මිය ශ්‍රී ලංකා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණ අධ්‍යයන අංශයේ ගණකාධිකරණය පිළිබඳ මහාචාර්යවරියකි. ඇය ගණකාධිකරණය පිළිබඳ පළමු පන්තියේ ශාස්ත්‍රවේදී උපාධිය, ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය සහ මූල්‍ය පිළිබඳ විශේෂීකරණය වූ දර්ශනශූරී උපාධිය ලබා ගෙන ඇත. විපුල පර්යේෂකයෙක් වන ඇය ආයතනික පාලනය, තිරසාරකත්ව හා සංකලිත වාර්තාකරණය සහ ගණකාධිකරණ අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් දේශීය හා විදේශීය වශයෙන් කෘති රාශියක් පළ කර ඇත. එමෙන්ම ආයතනික පාලනය පිළිබඳ ක්ෂේත්‍රයේ ඇගේ පර්යේෂණ කාර්යයන් වෙනුවෙන් ඇය සම්මාන දිනා ගෙන ඇති අතර ගණකාධිකරණය අධ්‍යාපනය හා සංකලිත වාර්තාකරණය පිළිබඳව වෘත්තීය ගණකාධිකරණ ආයතන මඟින් සංවිධානය කළ සංසදවල මණ්ඩල සාමාජිකයෙක් ලෙස සහභාගී වී ඇත. ඇය ජාතික විශ්වවිද්‍යාලවල, උසස් අධ්‍යාපන ආයතනවල හා ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලෝක බැංකුව අරමුදල් සපයන ව්‍යාපෘතිවල විෂයමාලාව ගොඩනැගීමේ හා තත්ත්ව සහතික ක්‍රියාකාරකම්වලට සක්‍රීය ලෙස දායක වෙයි. වර්තමානයේ දී ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයේ අධ්‍යක්ෂවරිය ලෙස ද සේවය කරයි.
මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා (2012 ජනවාරි 01 සිට)	මහාචාර්ය ඩබ්ලිව්. ඉන්ද්‍රලාල් ද සිල්වා මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ ජනගහන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙක් සහ හිටපු පීඨාධිපති වේ. වර්තමානයේ දී ඔහු ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ (NCAS) ජ්‍යෙෂ්ඨ පර්යේෂණ සාමාජිකයෙක් ලෙස සේවය කරයි. ඔහු කෘතීන්, ශාස්ත්‍රීය නිබන්ධන රාශියක්ප්‍රකාශයට පත් කර ඇති අතර අන්තර්ජාතික සම්මන්ත්‍රණ රාශියක දී පර්යේෂණ ලිපි ඉදිරිපත් කර, කීර්තිමත් අන්තර්ජාතික වාරසඟරාවල පර්යේෂණ ලිපි 60කට අධික සංඛ්‍යාවක් පළ කර ඇත. (වැඩි විස්තර සඳහා කරුණාකර http://indralal.elanka.net වෙත යොමුවෙන්න). මහාචාර්ය ද සිල්වා මහතා 1977 වසරේ දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන අධ්‍යයනය (සංඛ්‍යාලේඛන විද්‍යාව) පිළිබඳ සිය ශාස්ත්‍රවේදීඋපාධිය දිනා ගත් අතර පිළිවෙලින් 1985 වසරේ දී හා 1990 වසරේ දී කැන්බරාවල ඔස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය හා ආචාර්ය උපාධිය ලබා ගෙන ඇත. ඔහු 2004 වසරේ දී සිංගප්පූරුවේ ජාතික විශ්වවිද්‍යාලයේ දී, 1996 – 1991 කාලය තුළ මහජන සෞඛ්‍ය පිළිබඳ හාවඩ් පාසැලේ බාහිර

	මහාචාර්යවරයෙක් ලෙස සේවය කළ අතර 1990 – 1991 කාලය තුළ ඔස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයේ බාහිර අධිශිෂ්‍යත්වලාභියෙක් ලෙස කටයුතු කර ඇත. ඔහු ජ්‍යෙෂ්ඨ ෆුල්බ්‍රයිට් ශිෂ්‍යත්වය, ටකේමි සහ රොක්ෆෙලර් පදනම් ශිෂ්‍යත්ව ඇතුළු කීර්තිමත් සම්මාන රාශියක් අත්කර ගෙන ඇත. ඔහු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනු-ආයතන වන ESCAP, WHO, UNFPA, UNICEF වැනි සංවිධාන කීපයකම උපදේශකවරයෙක් ලෙස ද කටයුතු කර ඇත.
මහාචාර්ය පී.සී.පකීර් ජවුෆර් (2015 අප්‍රේල් 10)	මහාචාර්ය පී. සී. පකීර් ජවුෆර් මහතා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ පීඨාධිපති වේ. ඔහුගේ වසර 42ක ශික්ෂණ සේවා කාලයෙන් පසුගිය වසර 30ක්ම ඔහු විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනඥයෙක් ලෙස සේවය කර ඇත. ඔහුට ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශ විශ්වවිද්‍යාලවලින් උපාධි පිරිනමා ඇති අතර යාපනය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ගෞරව) උපාධිය ද කොළඹ විශ්වවිද්‍යාලයේ රන් පදක්කම හා විශිෂ්ට සාමාර්ථය ඇතිව අධ්‍යාපනය පිළිබඳ පශ්චාත්-උපාධි ඩිප්ලෝමාව ද විවෘත විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය ද කැනඩාවේ සයිමන් ෆ්‍රේසර් විශ්වවිද්‍යාලයේ Ed. D උපාධිය ද අත්කර ගෙන තිබේ. මෙයට අමතරව, ඔහු නව දිල්ලියේ IG අංකU ආයතනය, හොංකොං විවෘත විශ්වවිද්‍යාලය හා ජර්මනියේ ලිප්සිග් විශ්වවිද්‍යාලයේ දුරස්ථ අධ්‍යාපනය, ව්‍යවහාරික මනෝවිද්‍යාව හා විශේෂ අවශ්‍යතා සහිත අධ්‍යාපනය පිළිබඳව විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ඇත. එමෙන්ම ඔහු අධ්‍යාපනය පිළිබඳ ග්‍රන්ථ රාශියක් ද පර්යේෂණ ලිපි ද ප්‍රකාශයට පත් කර ඇත.
මහාචාර්ය ඕ.ජී දයාරත්න බණ්ඩා (2015 ඔක්තෝබර් 12 සිට)	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ පීඨාධිපති වන මහාචාර්ය ඕ. ජී. දයාරත්න බණ්ඩා මහතා 1995 වසරේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ පළමු වැනි පන්තියේ ශාස්ත්‍රවේදී ගෞරව උපාධියක් ද දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ගෙන ඇත. ඔහු ක්ෂුද්‍රආර්ථික විද්‍යාව හා මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂීකරණය වෙමින් සිංගප්පූරුවේ ජාතික විශ්වවිද්‍යාලයෙන් සිය දර්ශනශූරී උපාධිය දිනා ගන්නා ලදී. 1995 වසරේ සිට ඔහු ආර්ථික විද්‍යා හා සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශයේ කථිකාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් හා මහාචාර්යවරයෙක් ලෙස සේවය කර තිබේ. වර්තමානය වන විට ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශයේ මහාචාර්යවරයෙක් ලෙස කටයුතු කරයි. තව ද ඔහු 2006 සිට 2007 දක්වා කැනඩාවේ වෝටලූ විශ්වවිද්‍යාලයේ බාහිර පර්යේෂණ මහාචාර්යවරයෙක් ලෙස ද සේවය කර ඇත. මෙකී අධ්‍යාපනඥ තනතුරුවලට අමතරව ඔහු ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ පීඨාධිපති, කලා පීඨයේ පශ්චාත්-උපාධි වැඩසටහන්වල සභාපති හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශයේ අංශාධිපති ඇතුළු විවිධ පරිපාලන ධූරයන් ද හොබවා ඇත. ඔහු අන්තර්ජාතික නිර්දේශක වාරසඟරාවල ලිපි රාශියක් පළ කර ඇති අතරම ශාස්ත්‍රීය කෘතීන් ලෙස ග්‍රන්ථ හා පොත් පරිච්ඡේද රාශියක් ද ප්‍රකාශයට පත් කර ඇත. ඔහුගේ පර්යේෂණ අන්තර්ජාතික ආර්ථික විද්‍යාව හා සාර්වආර්ථික විද්‍යාව පිළිබඳ විවිධ අධ්‍යයනවල ගෝලීය වශයෙන් නිර්දේශ කර ඇත. ව්‍යවහාරික සාර්වආර්ථික විද්‍යාව, මූල්‍ය ආර්ථික විද්‍යාව, මුදල් ආර්ථික විද්‍යාව, ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ ගැටළු, අන්තර්ජාතික ආර්ථික සංකලනය හා වෙළඳ ගිවිසුම් ඔහුගේ පර්යේෂණ ක්ෂේත්‍රවලට ඇතුලත් වේ. තව ද ඔහු ප්‍රතිපත්ති සම්පාදන සාකච්ඡාවලට හා සමකාලීන ගැටළු පිළිබඳ විවාදවලට සක්‍රීයව දායක වන විද්වතෙක් ද වේ.

ඩබ්ලිව්.අයි නානායක්කාර (2015 ජුනි 19 සිට)	ඩබ්ලිව්. ඉන්දිරා නානායක්කාර මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ පීඨාධිපති වේ. ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිවේදී (ගෞරව) උපාධිය සහ දර්ශනපති උපාධිය දිනා ගෙන ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක් වන ඇය ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක් ද වේ. වර්තමානය වන විට ඇය ප්‍රථම උපාධි හා පශ්චාත්-උපාධි මට්ටම්වලට සමාගම් නීතිය, අන්තර්ජාතික ආයෝජන නීතිය, ව්‍යාපාර නීතිය, වාණිජ බේරුම්කරණය හා බැංකු නීතිය උගන්වනු ලබයි. එමෙන්ම ඇය අන්තර්ජාතික ආයෝජන නීතිය හා ගෝලීයකරණය, ආයතනික නීතිය, පාරිභෝගික නීතිය, බැංකු නීතිය, තරඟකාරීත්ව නීතිය වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ජාතික හා අන්තර්ජාතික වශයෙන් ලිපි ඉදිරිපත් කර ඇත.
මහාචාර්ය එම්.ඩී.ඒ.එල්. රණසිංහ (2012 ජනවාරි 01)	මහාචාර්ය අතුල රණසිංහ මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්යවරයෙකි. මේ වන විට ඔහු එම විශ්වවිද්‍යාලයේම කලා පීඨයේ පීඨාධිපති ලෙස ද කටයුතු කරයි. ඔහු ආර්ථික මිතිකය පිළිබඳ විශේෂීකරණය වෙමින් කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙකි. ප්‍රථම උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසුව ඔහු සහකාර කථිකාචාර්යවරයෙක් ලෙස ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයට බැඳුනි. පශ්චාත්-උපාධි ඩිප්ලෝමා වැඩසටහන නිමා කිරීමෙන් පසුව ඔහු තායිලන්තයේ තමාසට් විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය අධ්‍යයනය සඳහා බැඳුනි. මහාචාර්ය අතුල රණසිංහ මහතා නෙදර්ලන්තයේ ඇමැස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා හා ආර්ථික මිතිකය පිළිබඳ පීඨයේටින්බර්ජන් ආයතනයේ සිය දර්ශනපති උපාධිය සම්පූර්ණ කරන ලදී. ඔහුගේ දර්ශනපති උපාධිය සඳහා ඔහු "අ පර්ල් ඔෆ් ග්‍රේට් ප්‍රයිස්: ද ෆ්‍රී එඩ්යුකේෂන් සිස්ටම් ඉන් ශ්‍රී ලංකා" (ඉහළ මිලක මුතු ඇටය: ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමය) යන තේමාව රැගත් නිබන්ධනයක් ඉදිරිපත් කරන ලදී. මහාචාර්ය රණසිංහ මහතා ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ ප්‍රධානියා ලෙස වසර තුනක කාලයක් සේවය කළ අතර වර්තමානයේ දී ඔහුගේ දෙවැනි ධූර කාලය ලෙස පීඨාධිපති වශයෙන් සේවය කරයි. ෆිජි විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කළ එතුමා ඔස්ට්‍රේලියාවේ මැක්කුරී විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ "ගෞරව මහාචාර්යවරයෙක්" ලෙස ද සේවය කර ඇත. එමෙන්ම ඔහු ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශක ආර්ථික විද්‍යාඥයෙක් ලෙස ද කටයුතු කර ඇත. ඔහුගේ ධූර කාලය තුළ දී ඔහු කර්මාන්ත අමාත්‍යාංශය මඟින් සංවිධානය කළ ආසියානු සංවර්ධන බැංකුව අනුග්‍රහය දක්වන ලද පාලන නීති ඉවත් කිරීමේ සම්මන්ත්‍රණයේ හා SME ධවල පත්‍රිකාව කෙටුම්පත් කිරීමේ උපදේශක ආර්ථික විද්‍යාඥයෙක් ලෙස සේවය කරන ලදී. මහාචාර්ය රණසිංහ මහතා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA)වැනි ආයතනවල උපදේශක ආර්ථික විද්‍යාඥයෙක් ලෙස ද සේවය කර ඇත.

මහාචාර්ය ඒ.එච්.එම්.එච් අභයරත්න (2012 ජනවාරි 01 සිට)	මහාචාර්ය ඒ. එච්. එම්. එච්. අභයරත්න මහතා කැලණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයන අංශයේ මහාචාර්යවරයෙක් වන අතර 2005 වසරේ දෙසැම්බර් මාසයේ දී එම අධ්‍යයන අංශයේ ප්‍රධානියා ලෙස පත් කරන ලදී. 2010 දෙසැම්බර් සිට ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති ලෙස සේවය කරයි. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී හා දර්ශනපති උපාධි දිනා ගත්තෙකි. එයට අමතරවකැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක හා විශ්වවිද්‍යාල ගුරුවරුන්ගේ සංගමයේ සම-ලේකම් ද වේ.

NCAS හි යහපාලනය

NCAS 2017 වසර තුළ දී සිදු කළ සියලුම ක්‍රියාකාරකම් හරහා යහපාලන ව්‍යවහාර ක්‍රියාත්මක කිරීමට සහ උසස් ප්‍රමිතීන් අදාළ කර ගැනීමට කැපවුනි. මෙමඟින් අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුකූලවීම, ගනුදෙනුවල විනිවිදභාවය වැඩිදියුණු කිරීම, වගවීම සහ රජයේ අරමුදල් සඳහා වගකීම වැඩිදියුණු කරයි.

1) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට සහ NCAS ආඥාපනතට අනුකූලවීම

<u>පාලක සභාවේ පත්වීම් සහ සංයුතිය.</u>

පාලක සභාව NCAS හි තීරණ ගැනීමේ අධිකාරිය ලෙස පත් කර තිබෙන අතර එහි සංයුතිය පහත පරිදි වේ.

1) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා -
   ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති -
   මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා

3) NCAS කළමනාකරණ සභාවේ සභාපති -
   මහාචාර්ය පී. එස්. එම්. ගුණරත්න මහතා

4) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අදාළ ස්ථාවර කමිටු මඟින් නම් කළ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයන්ට අදාළ පීඨ හයේ පීඨාධිපතිවරු

මහාචාර්ය එස්. වැව්වගේ	පීඨාධිපති, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය රුහුණ විශ්වවිද්‍යාලය
මහාචාර්ය එන්. ඥානකුමාරන්	පීඨාධිපති, කලා පීඨය යාපනය විශ්වවිද්‍යාලය
ඩබ්ලිව්. අයි. නානායක්කාර මහත්මිය	පීඨාධිපති, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ඕ. ජී. දයාරත්න බණ්ඩා	පීඨාධිපති, කලා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
මහාචාර්ය එම්. ඩී. ඒ. එල්. රණසිංහ	පීඨාධිපති,කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ඒ. එච්. එම්. එච්. අබේරත්න	පීඨාධිපති,සමාජ විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

5) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කළ සාමාජිකයින් සිව්දෙනා.

මහාචාර්ය පී. එස්. එම්. ගුණරත්න -උපසභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

මහාචාර්ය ජයදේව උයන්ගොඩ

මහාචාර්ය නයනි මෙලගොඩ මහත්මිය

මහාචාර්ය ඩැනී අතපත්තු

සභාවේ ගණපූරණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකි.

<u>කළමනාකරණ සභාවේ පත්වීම් සහ සංයුතිය</u>

කළමනාකරණ සභාව NCASහි කළමනාකරණ තීරණ ගැනීමේ අධිකාරිය ලෙස පත් කර තිබෙන අතර එහි සංයුතිය පහත පරිදි වේ.

1) සභාවේ සභාපති වන අධ්‍යක්ෂක
   මහාචාර්ය පී. එස්.එම්. ගුණරත්න

2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අදාළ ස්ථාවර කමිටු මඟින් නම් කළ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයන්ට අදාළ පීඨ හයේ පීඨාධිපතිවරු

ආචාර්ය ඩී.පී.එස් චන්ද්‍රකුමාර	පීඨාධිපති, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මහාචාර්ය ඒ. එච්. එම්. එච්. අබේරත්න	පීඨාධිපති, සමාජ විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
මහාචාර්ය පී. සී. පකීර් ජවුෆර්	පීඨාධිපති, අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මහාචාර්ය ඕ. ජී. දයාරත්න බණ්ඩා	පීඨාධිපති, කලා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ඩබ්ලිව්. අයි. නානායක්කාර මහත්මිය	පීඨාධිපති, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය එම්. ඩී. ඒ. එල්. රණසිංහ	පීඨාධිපති, කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

03) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කළ සාමාජිකයින් සිව්දෙනා

මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා
මහාචාර්ය අයි. එම්. කේ. ලියනගේ
මහාචාර්ය ජේ. ඒ. එස්. කේ. ජයකොඩි
මහාචාර්ය සමන්ති සේනාරත්න මහත්මිය

සභාවේ ගණපූරණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකි.

2) රජයේ මූල්‍ය රෙගුලාසි සහ රාජ්‍ය කාර්යපටිපාටියට අනුකූලවීම

NCAS රජයේ සම්පූර්ණ අරමුදල්ලාභී ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන බැවින් සිදු කළ සියලුම මූල්‍ය ගනුදෙනු රජයේ මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා මාර්ගෝපදේශ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කළ චක්‍රලේඛ ආදියට අනුකූලව වාර්තා කරනු ලැබේ.

3) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

වසර තුළ දී අත්කර ගත් සියලුම භාණ්ඩ හා සේවා ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව සිදු කර ඇත. NCAS කළමනාකරණ සභාව විසින් ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කරන ලදී. එම කමිටුවල සේවය කළ සාමාජිකයින් පහත දැක්වෙන පරිදි වේ.

<u>අධ්‍යයන අංශ ප්‍රසම්පාදන කමිටු (සුළු)</u>

එච්. පී. හේනේගම මහත්මිය/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / NCAS - සභාපති

ජී. පී. වික්‍රමාරච්චි මහත්මිය/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (වැඩබලන) - සාමාජික

ටී. එල්. ධර්මසේන මහත්මිය/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / NCAS - සභාපති /සාමාජික

ඒ.ඒ.එස්. චින්තානි මහත්මිය - සාමාජික

බී. කේ. සාගරිකා මහත්මිය/ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / NCAS - සාමාජික

<u>තාක්ෂණික ඇගයීම් කමිටුව</u>

එම්. ඒ. මිල්ටන් මහතා / ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති / NCAS

එස්. චන්ද්‍රසේන මහතා / සහකාර ජාල කළමනාකරු / NCAS

4) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය සහ බඳවා ගැනීමේ පටිපාටිය

වැටුප්, පත්වීම්, උසස්වීම්, වැටුප් වර්ධක හා නිවාඩු ඇතුළු සියලුම කාර්ය මණ්ඩල කටයුතු විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයට හා බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව සිදු කර ඇත. මුදල් අමාත්‍යාංශය නිකුත් කළ චක්‍රලේඛ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ ද කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා සඳහා අදාළ කර ගෙන තිබේ.

5) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති (SLPSAS), ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) සහ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRSs)

NCAS හි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) හඳුන්වා දී නෙමැති ගනුදෙනු වාර්තා කිරීම සඳහා ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) හා අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) අදාළ කර ගෙන ඇත

6) අපේක්ෂකයින් තෝරා ගැනීම සහ පශ්චාත්උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා වූ NCAS මාර්ගෝපදේශ

ඉහත මාර්ගෝපදේශවලට අනුව දර්ශනශූරි උපාධි ශිෂ්‍යත්ව සඳහා අපේක්ෂකයින් තෝරා ගනු ලැබේ. කළමනාකරණ සභාව මඟින් තේරීම් කමිටු පත්කර ඇත.

අධ්‍යයන නිවාඩු සඳහා හිමිකම් කියන ස්ථිර අපේක්ෂකයින් NCAS හි පශ්චාත්උපාධි ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබති. අපේක්ෂකයින්ට ශාස්ත්‍රපති උපාධියක් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගන්නා විශ්වවිද්‍යාලයෙන් ලද වලංගු පත්වීමක් තිබිය යුතුය.

වසරක් සඳහා ප්‍රදානවල ප්‍රමාණය පහත දැක්වෙන පරිදි තීරණය කරනු ලැබේ:

- දේශීය විශ්වවිද්‍යාලවල ලියාපදිංචි වී ඇති ඉල්ලුම්කරුවන්ට, නිල ආයතනික ගාස්තුව හා පර්යේෂණ වියදම් මත පදනම්ව, වසරකට ලබා දෙන ප්‍රදාන ප්‍රමාණය තීරණය කරනු ලැබේ.

- විදේශීය විශ්වවිද්‍යාලවල ලියාපදිංචි වී ඇති ඉල්ලුම්කරුවන්ට, නිල ආයතනික ගාස්තුව හා රටට අදාළව එහි ජීවන වියදම් මත පදනම්ව, එක් පුද්ගලයෙකුට වසරකට ලබා දෙන ප්‍රදාන ප්‍රමාණය තීරණය කරනු ලැබේ.මෙම කාණ්ඩය යටතේ වසරකට උපරිමය වන්නේ රුපියල් මිලියන 1.4 කි.

NCAS හි කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ

- මහාචාර්ය පී. එස්. එම්. ගුණරත්න
  වැඩබලන අධ්‍යක්ෂ
  උප සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කළමනාකරණ කාර්ය මණ්ඩලය

- එච්.පී. හේනේගම මිය
  ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
  BSc Agriculture (special) (PDN), MBA (Wayamba), MPhil (PDN)

- ගයනි වික්‍රමාරච්චි මහත්මිය
  ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (වැඩ බලන)
  BSc (Agri) (Hons.) (Ruhuna), Master of Public Administration (CMB)

- ටී. එල්. ධර්මසේන මිය
  ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
  BSc (Accountancy) (SJP), ACA

- ඒ.ඒ.එස්. චින්තිනි මෙනෙවිය
  ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
  BBMgt (Accountancy) (KLN), Master in Business in Accountancy (KLN)

- එම්.ඒ.මිල්ටන් මහතා
  ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
  BA (Special) (SJP)), Master in Social Sciences
  Pg Dip in Library & Information Science (KLN)
  Pg Dip. in Writer-ship & Communication (SJP)

- සම්පත් චන්ද්‍රසේන මහතා
  සහකාර ජාල කළමනාකරු (I ශ්‍රේණිය)
  MSc. in Information Security (CMB), BIT in Information Technology (UCSC)
  Diploma in Management (OUSL), Higher Diploma in Information Technology (CMB)
  බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ සාමාජික (MBCS) සහ ශ්‍රී ලංකා පරිගණක සමාජයේ සාමාජික (MCSSL).

<u>වෙනත් කාර්ය මණ්ඩලය</u>

- ඒ. එල්. ඩී. පෙරේරා මහතා - පුස්තකාල සහකාර (II ශ්‍රේණිය)
- යූ. ඩී. විතානගේ මහත්මිය - පරිගණක යෙදුම් සහායක (III ශ්‍රේණිය)
- කේ. එම්. ජී. ජී. ධනුෂ්ක මහතා - පොත් තබන්නා (II ශ්‍රේණිය)
- පී. ඒ. එච්. ඊ. දේවප්‍රිය මහත්මිය - පරිගණක යෙදුම් සහායක (III ශ්‍රේණිය)
- ආර්. කේ. පී. අයි. රත්නායක මහතා - පරිගණක යෙදුම් සහායක (III ශ්‍රේණිය)
- විනෝදිත හෙට්ටිආරච්චි මහතා - පරිගණක යෙදුම් සහායක (III ශ්‍රේණිය)
- ආර්.ජී .එම් සංජීව මහතා - රියදුරු
- ඩබ්ලිව්. ඒ.ඩී.එස් වීරක්කොඩි - කාර්යාල සහායක
- පී.පී.කේ. බාලසූරිය මහතා - කාර්යාල සහායක
- එච්.එස්.බී.කරුණාරත්න මහතා - කාර්යාල සහායක

අංකය	තනතුර		ශ්‍රේණිය		අනුමත සේවක සංඛ්‍යාව	2017.12.31 දිනට සිටිනා කාර්ය මණ්ඩල සංඛ්‍යාව
			ජ්‍යෙෂ්ඨ මට්ටම			
1	අධ්‍යක්ෂ				1	1
2	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති		II		1	1
3	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී				1	1
4	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී				1	1
			තෘතීය මට්ටම			
5	සහකාර ජාල කළමනාකරු		II		1	1
			ද්විතීය මට්ටම			
6	පරිගණක යෙදුම් සහායක		III		4	3
7	පොත් තබන්නා		II		1	1
8	පුස්තකාල සහකාර		III		1	1
			ප්‍රාථමික මට්ටම			
9	රියදුරු		II		1	1
10	කාර්යාල සහායක		III		2	1

වැඩමුළු/පාඨමාලා/ඉදිරිපත්කිරීම්

NCAS විසින් 2017 වර්ෂය තුළ දී වත්මන් ගැටළු පිළිබඳ පහත දැක්වෙන ඉදිරිපත් කිරීම්, පාඨමාලා සහ වැඩමුළු පවත්වන ලදී.

පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි වේ:

වගුව 1: 2017 වර්ෂය තුළ පවත්වන ලද වැඩමුළු/ පාඨමාලා/ ඉදිරිපත් කිරීම් පිළිබඳ සාරාංශය

අංකය	සම්මන්ත්‍රණය	පවත්වන ලද දිනය	ඉලක්කගත කණ්ඩායම	සහභාගීත්වය	සටහන
1.	"ජර්මනියේ උසස් අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා පිළිබඳ සම්මන්ත්‍රණය" චමින්ද හෙට්ටිආරච්චි මහතා	2017 දෙසැම්බර් 12 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ දී	විශ්වවිද්‍යාල අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය	50	අවසන් කර ඇත
අංකය	**පාඨමාලාව**	**පවත්වන ලද දිනය**	**ඉලක්කගත කණ්ඩායම**	**සහභාගීත්වය**	**සටහන**
2.	"සංඛ්‍යානමය විශ්ලේෂණය සඳහා SPSS වෙත හැඳින්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව" ආචාර්ය නිශාරා ප්‍රනාන්දු හා එස්. චන්ද්‍රසේන	2017 ජනවාරි 8,15,22,29 NCAS පරිශ්‍රයේ දී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	10	අවසන් කර ඇත
3.	"සංඛ්‍යානමය විශ්ලේෂණය සඳහා SPSS වෙත හැඳින්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව" ආචාර්ය නිශාරා ප්‍රනාන්දු හා එස්. චන්ද්‍රසේන	2017 මාර්තු 12,19,26 සහ අප්‍රේල් 2 NCAS පරිශ්‍රයේ දී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	12	අවසන් කර ඇත
4.	"සංඛ්‍යානමය විශ්ලේෂණය සඳහා SPSS වෙත හැඳින්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව" ආචාර්ය නිශාරා ප්‍රනාන්දු හා එස්. චන්ද්‍රසේන	2017 මැයි 4,14,21,28 NCAS පරිශ්‍රයේ දී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	11	අවසන් කර ඇත
5.	"සංඛ්‍යානමය විශ්ලේෂණය සඳහා SPSS වෙත හැඳින්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව" ආචාර්ය නිශාරා ප්‍රනාන්දු හා එස්. චන්ද්‍රසේන	2017 ජූලි 23,30 සහ අගෝස්තු 3,13 NCAS පරිශ්‍රයේ දී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	6	අවසන් කර ඇත
6.	"සංඛ්‍යානමය විශ්ලේෂණය සඳහා SPSS වෙත හැඳින්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව" ආචාර්ය නිශාරා ප්‍රනාන්දු හා එස්. චන්ද්‍රසේන	2017 නොවැම්බර් 5,12,18,19 NCAS පරිශ්‍රයේ දී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	11	අවසන් කර ඇත
7.	අධ්‍යයන රචනය පිළිබඳ කෙටි පාඨමාලාව මහාචාර්ය මංගල ෆොන්සේකා	2017 මැයි 19 සහ ජූනි 02 NCAS පරිශ්‍රයේ දී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය	23	අවසන් කර ඇත

අංකය	වැඩමුළු	පවත්වන ලද දිනය	ඉලක්කගත කණ්ඩායම	සහභාගීත්වය	සටහන
8.	"AMOS පිළිබඳ වැඩමුළුව" ආචාර්ය නිලක්ෂි ගලහිටියාවේ	2017 අප්‍රේල් 4,5 NCAS පරිශ්‍රයේ දී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	15	අවසන් කර ඇත
9.	"AMOS පිළිබඳ වැඩමුළුව" ආචාර්ය නිලක්ෂි ගලහිටියාවේ	2017 අප්‍රේල් 25,26 NCAS පරිශ්‍රයේ දී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	9	අවසන් කර ඇත
10.	"AMOS පිළිබඳ වැඩමුළුව" ආචාර්ය නිලක්ෂි ගලහිටියාවේ	2017 සැප්තැම්බර් 12,13 NCAS පරිශ්‍රයේ දී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	10	අවසන් කර ඇත
11.	ව්‍යාපාර හා පරිපාලනමය රචනය පිළිබඳ වැඩමුළුව කේ .ඩී .එස්. එන්. විජේසිරි මහතා	2017 ඔක්තෝබර් 12,13 NCAS පරිශ්‍රයේ දී	විශ්වවිද්‍යාල පරිපාලන කාර්ය මණ්ඩලය	30	අවසන් කර ඇත
12.	විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා විනය ක්‍රියාපටිපාටිය පිළිබඳ වැඩමුළුව එන් සෙල්වකුමාරන් මහතා	2017 නොවැම්බර් 09 NCAS පරිශ්‍රයේ දී	විශ්වවිද්‍යාල පරිපාලන කාර්ය මණ්ඩලය	30	අවසන් කර ඇත
13.	මයික්‍රො සොෆ්ට් එක්සෙල් උසස් වැඩමුළුව සුමුදු සේකරගේ මහතා	2017 මාර්තු 23,24 NCAS පරිශ්‍රයේ දී	පරිගණක යෙදුම් සහායක සහ පොත් තබන්නන්	22	අවසන් කර ඇත
14.	මයික්‍රො සොෆ්ට් එක්සෙල් උසස් වැඩමුළුව සුමුදු සේකරගේ මහතා	2017 නොවැම්බර් 23,24 NCAS පරිශ්‍රයේ දී	පරිගණක යෙදුම් සහායක සහ පොත් තබන්නන්	24	අවසන් කර ඇත
15.	තොරතුරු තාක්ෂණ ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව සම්පත් චන්ද්‍රසේන මහතා	2017 නොවැම්බර් 08 NCAS පරිශ්‍රයේ දී	විධායක කාර්ය මණ්ඩලය	11	අවසන් කර ඇත

"ජර්මනියේ උසස් අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා" පිළිබඳ සම්මන්ත්‍රණය

කොළඹ පිහිටි ජර්මන් තානාපති කාර්යාලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධව "ජර්මනියේ උසස් අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා" පිළිබඳ සම්මන්ත්‍රණයක්, ශ්‍රී ලංකාව පදනම් කරගත් ශාස්ත්‍රීය සහ කළමනාකරණ උපදේශකයෙකු හා ජර්මානු උපාධිධාරියෙක් වන චමින්ද හෙට්ටිආරච්චි මහතා විසින් 2017 දෙසැම්බර් මස 12 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශ්‍රවණාගාරයේ දී පැවැත්වූ අතර අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය 50කට වැඩි පිරිසක් ඒ සඳහා සහභාගී විය.

සංඛ්‍යානමය විශ්ලේෂණය සඳහා SPSS හඳුන්වාදීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල		1,707,389.92	1,440,000.00
ආයතනික සංවර්ධන අරමුදල		3,137,446.74	2,887,446.74
		75,324,784.93	**77,005,712.38**
ජංගම නොවන වගකීම්			
නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම	**20**	1,332,227.83	1,222,838.65
		1,332,227.83	**1,222,838.65**
ජංගම වගකීම්			
උපචිත වියදම්	**21**	374,858.95	352,813.75
ගෙවිය යුතු දෑ	**22**	35,893,977.89	50,245,739.71
		36,268,836.84	**50,598,553.46**
		112,925,849.60	**128,827,104.49**

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සඳහා NCAS වගකිව යුතුය.
NCAS වෙනුවෙන් අත්සන් කළේ.

1. ....
අධ්‍යක්ෂ දිනය

2. .....
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

3. .....
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ
උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS)

අරමුදල්වල වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය
2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

	විලම්බිත ප්‍රාග්ධන රු.	වියදම් නොකළ ප්‍රාග්ධන රු.	සමුච්චිත අරමුදල රු.	කාර්ය මණ්ඩල හා සංවර්ධන අරමුදල රු.	ආයතනික හා සංවර්ධන අරමුදල රු.	එකතුව රු.
2015 ජනවාරි 1 වැනි දිනට ශේෂය	63,057,335.47	731,331.97	1,769,734.87	2,475,000.00		68,033,402.31
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)	-	-	252,844.77	-		252,844.77
ශුද්ධ සංචලනයන්	(834,272.88)	6,872,600.92	-	1,000,000.00		7,038,328.04
2016 ජනවාරි 1 වැනි දිනට ශේෂය	62,223,062.59	7,603,932.89	2,022,579.64	3,475,000.00		75,324,575.12
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)			211,222.99			211,222.99
ශුද්ධ සංචලනයන්	223,111.40	394,356.13		852,446.74		1,469,914.27
2017 ජනවාරි 1 වැනි දිනට ශේෂය	62,446,173.99	7,998,289.02	2,233,802.63	1,440,000.00	2,887,446.74	77,005,712.38
පෙර වසර ගැලපීම			(2,216,099.88)	17,389.92	-	(2,198,709.96)
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)			1,237,687.92	250,000.00	250,000.00	1,737,687.92
ශුද්ධ සංචලනයන්	(1,734,854.99)	514,949.58				(1,219,905.41)
						-
2017 ජනවාරි 1 වැනි දිනට ශේෂය	**60,711,319.00**	**8,513,238.60**	**1,255,390.67**	**1,707,389.92**	**3,137,446.74**	**75,324,784.93**
						75,324,784.93
						-

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	**2017**	**2016**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා (පාවිච්චි කළ) / මුදල් ප්‍රවාහ		
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)	1,237,687.92	211,222.99
පෙර වර්ෂයේ ගැලපුම්		
ගැලපුම් සඳහා		
රජයේ ප්‍රතිපාදන ක්‍රමක්ෂය	(3,868,989.78)	(3,519,193.04)
ක්ෂය වීම්	3,868,989.78	3,519,193.04
විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන	109,389.18	184,365.65
කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල	500,000.00	1,000,000.00
වෙනස් වීම්වලට පෙර ක්‍රියාකාරී ප්‍රාග්ධනයේ මෙහෙයුම් අතිරික්තය	1,847,077.10	1,395,588.64
ක්‍රියාකාරී ප්‍රාග්ධනයේ වැඩිවීම්/(අඩුවීම්)		
භාණ්ඩ ලේඛන	11,166.26	57,750.96
පෙර ගෙවුම් හා තැන්පතු	(602,830.05)	(1,200,725.63)
උපචිත වියදම්	22,045.20	124,668.67
ගෙවිය යුතු ගිණුම්	(14,351,761.82)	15,527,005.04
මෙහෙයුම් වලදී ජනිත වූ මුදල්	(14,921,380.41)	14,508,699.04
බදු ගෙවීම්		
පාරිතෝෂික ගෙවීම්	-	-
පොලී ගෙවීම්	-	-
	-	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	(13,074,303.31)	15,904,287.68
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා (භාවිත කළ) මුදල් ප්‍රවාහ		
දේපළ හා යන්ත්‍ර සූත්‍ර අත්පත් කර ගැනීම්	(2,134,134.79)	(2,631,904.68)
ආයෝජන ක්‍රියාකාරකම් වල භාවිතා කළ ශුද්ධ මුදල්	(2,134,134.79)	(2,631,904.68)
මූල්‍ය ක්‍රියාකාරකම් වල භාවිතා කළ ශුද්ධ මුදල්		
වර්ෂය තුළ ලද ශුද්ධ අරමුදල්	450,374.41	2,878,707.55
මූල්‍ය ක්‍රියාකාරකම් වල භාවිතා කළ ශුද්ධ මුදල්	450,374.41	2,878,707.55
මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	(14,758,063.69)	16,151,090.55
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් හා සමාන දෑ	64,250,734.43	48,099,643.88
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් හා සමාන දෑ	**49,492,670.74**	**64,250,734.43**

ගිණුම්කරණ ප්‍රතිපත්ති

2017 දෙසැම්බර් 31

1. ආයතනික තොරතුරු

1.1 ලියාපදිංචි රට සහ නීතිමය රාමුව

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය යනු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි මධ්‍යස්ථානයකි. එය 6A, සුකස්තාන් ගාර්ඩන්, වෝඩ් පෙදෙස, කොළඹ 07 ලිපිනයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ෂේත්‍රය තුළ උසස් අධ්‍යයන හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

මධ්‍යස්ථානය එහි පැවැත්ම උදෙසා රජයේ අරමුදල් මත ක්‍රියාත්මක වේ. තවද, විශ්වවිද්‍යාල ගුරුවරුන් සඳහා දර්ශනපති/ දර්ශනශූරී ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා අරමුදල් සපයයි.

1.3 සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානයේ දී සේවක සංඛ්‍යාව 14ක් විය.

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 අනුකූලතා ප්‍රකාශය

NCAS හි මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් හඳුන්වා දී ඇති පොදුවේ පිළිගත හැකි මූලධර්ම සහ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇත. සංවිධානයේ ගනුදෙනු සහ ගිණුම් ශේෂ සමඟ කටයුතු කරන හඳුන්වා දුන් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත නොමැති විට, මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී එම ශේෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ සම්මතයන්ගේ (SLFRS) අදාළ ප්‍රතිපාදන හා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) භාවිතා කර ඇත. භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර මූල්‍ය වර්ෂවල භාවිතා කළ ඒවා සමඟ අනුරූප වී ඇත.

2.2 මූල්‍ය ප්‍රකාශනවල වගකීම.

NCAS හි කළමනාකරණය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකිව යුතුය.

2.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය අඛණ්ඩ පැවැත්මකින් ආයතනයේ ඉදිරි මෙහෙයුම් කර ගෙනයාමේ හැකියාව තක්සේරු කර ඇත. කළමනාකරණය NCAS හට පූර්වේක්ෂණය කළ හැකි අනාගතයකට මෙහෙයුම් පැවැත්මේ ඉදිරියට යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට සාධාරණ අපේක්ෂාවක් ඇත. NCAS අනාගතය පිළිබඳ සියලු ලබාගත හැකි තොරතුරු සළකා බැලීමෙන්, ඈවර කිරීමට හෝ මෙහෙයුම් නැවැත්වීමට අවශ්‍යතාවක් පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව, NCASහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම පදනම යොදා ගැනීමට ඉදිරියට කර ගෙන යයි.

2.4 පශ්චාත් ශේෂ පත්‍ර සිදධි

මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන ප්‍රමාණවත් පශ්චාත් ශේෂ පත්‍ර සිද්ධි නොතිබුනි.

2.5 වත්කම් සහ ඒවායේ ඇගයීම් කිරීමේ පදනම්

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය අඩු කළ පිරිවැයට වාර්තා කර ඇත. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන ඕනෑම අනියම් වියදම් සමඟ මිල දී ගැනුම් හෝ ඉදිකිරීම් පිරිවැය වේ.

SLPSAS 7 අනුව මිල දී ගන්නා වර්ෂය තුළ මුළු වර්ෂයෙහි ක්ෂය වෙන්කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ මත ක්ෂය ඒවායේ පිරිවැය මත පහත අනුපාතයන් යටතේ වෙන්කර තිබේ.

වත්කම	ක්ෂය අනුපාතය වර්ෂයකට (%)
ගොඩනැගිලි	5
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	10
කාර්යාල උපකරණ	20
පරිගණක හා මෘදුකාංග	20
පුස්තකාල පොත්	20

(ඉහත අනුපාතික නියෝග චක්‍රලේඛ අංක 649 මත පදනම්ව තීරණය කරයි)

2.6 තොග

FIFO පදනම මත පදනම්ව තොග පිරිවැයට අගය කරනු ලැබේ.

2.7 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ ඒවා උපලබ්ධි කිරීමට තක්සේරු කළ වටිනාකමට දක්වා ඇත.

2.8 සේවක ණය

අ) සේවක ණය පහත දැක්වෙන පරිදි වෙළඳ බැංකු ණය දෙන සාමාන්‍යයට සමාන සඵල පොළී අනුපාතය භාවිතයෙන් මූල්‍ය උපකරණ හඳුනාගැනීම පිළිබඳ LKAS 39 සමඟ අනුකූලව ක්‍රමක්ෂය කළ පිරිවැය ක්‍රමයට තක්සේරු කර ඇත.

2017 8.9%

2016 12%

ආ) <u>කලින් ගෙවූ සේවක පිරිවැය</u>

මෙය අධිකාරියේ සේවාදායකයන් වෙත සහනදායී අනුපාතයට දෙන ලද සේවක ණයවලින් පැන නඟින ශේෂය නිරූපණය කරයි.

2.9 වත්කම් සහ වෙන්කිරීම්

ශේෂපත්‍ර දිනට සියළු දන්නා වගකීම් මූල්‍ය ප්‍රකාශවල අඩංගු කර ඇති අතර පවතින්නේ යැයි දන්නා නමුත් වටිනාකම නිවැරදිව තක්සේරු කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන්කිරීමක් කර ඇත.

2.10 ප්‍රදාන සඳහා ගිණුම්කරණය

රජයේ ප්‍රධාන LKAS 20ට අනුකූලව ගිණුම්ගත කර ඇති අතර රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන විලම්බිත ආදායම් ලෙස සලකනු ලබන අතර අදාළ දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට ප්‍රාග්ධනිත කර ඇත. එමෙන්ම ප්‍රදාන, වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමවත් පදනමක් මත ආදායම ලෙස හඳුනා ගෙන ඇති අතර දර්ශනශූරී, දර්ශනපති ප්‍රදාන ඇතුළුව ප්‍රනරාවර්තන ප්‍රදාන වාරික ආදායම් ලෙස ගණනය කර ඇත.

2.11 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්

සියළු ප්‍රමාණාත්මක බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් සැලකිල්ලට ගෙන ඇති අතර මෙම මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය පරිදි ගැළපුම් සහ හෙළිදරව් කිරීම් කර ඇත.

2.12 සේවක ප්‍රතිලාභ

නිශ්චිත දායකත්ව සැලසුම්

සේවකයන්ට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් (UPF) දායකත්ව, සේවක භාරකාර අරමුදල (ETF), විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල යන දායකත්වයන්ට අදාළ වූ ව්‍යවස්ථාවන් සහ නියාමනයන්ට අනුරූපව සුදුසුකම් ලබයි. NCAS විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල වෙත සේවකයන්ගේ ජීවන වියදම් දීමනාව එකතුව මූලික සංවේතනවල ස්ථාවර දායකත්ව ගෙවන අතර වැඩිපුර ප්‍රමාණයන් ගෙවීමට නීතිමය හෝ අනුමිත බැඳීමක් නොතිබෙනු ඇත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායකත්ව සැලසුම් හැර පශ්චාත්-සේවක සැලසුම් වේ. NCAS 1983 අංක 12 දරන පාර්තෝෂික පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට වගකීමෙන් බැඳේ. පනත යටතේ බැඳීම් සඳහා වෙන්කිරීම, පහත පරිදි රජයේ බැඳුම්කර අනුපාතිකය සහ අපේක්ෂිත වාර්ෂික වැටුප් වර්ධක අනුපාතිකයට සමාන වට්ටම් අනුපාතික භාවිතයෙන් LKAS 19 ට අනුකූලව වර්තමාන අගය ක්‍රමය පදනම්ව තීරණය කරනු ලැබේ.

වර්ෂය	බැඳුම්කර අනුපාතිකය	වැටුප් වර්ධක අනුපාතිකය
2017	8.9%	10%
2016	12%	10%

2.13 සේවක හා ආයතනික සංවර්ධන අරමුදල

සේවක හා ආයතනික සංවර්ධන අරමුදල වැඩමුළු සහ අධ්‍යයන පාඨමාලා තුළින් අභ්‍යන්තරව උත්පාදන කළ අරමුදල්වලින් නිරූපණය කරයි. වටිනාකම කළමනාකරණ විනිශ්චය මඟින් තීරණය කරයි.

2.14 අසම්භාව්‍ය වත්කම්

ප්‍රතිලාභීන් සහ විශ්වවිද්‍යාල අතර එළැඹී ගිවිසුමට අනුව, ප්‍රදාන නැවත අයකර ගැනීම්වල අයකර ගත හැකි වටිනාකමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග අදාළ විශ්වවිද්‍යාල මඟින් නිතිපති දෙපාර්තමේන්තුව හරහා ගෙන ඇත. ප්‍රදාන නැවත අයකර ගත් අදාළ ප්‍රතිලාභීන්ගෙන් ලැබිය යුතු වටිනාකම මුදල් පදනම මත ගණනය කෙරේ. පහත ලැබිය යුතු මුදල ප්‍රදාන ඉල්ලා අස්කර ගෙන ඇති සහ විශ්වවිද්‍යාලය විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති ප්‍රදානලභීන් වෙතිනි.

2006	එච්. සිරිවර්ධන මිය	(ශ්‍රීපාලි)	රු.500,000/-
	ජේ.ටී. ද සිල්වා මිය	(පේරාදෙණිය)	රු.1,602,630/-
	ඩබ්ලිව්.පී.ජී.ඒ.එන්. ද සිල්වා මිය	(කැලණිය)	රු.3,315,789/-
2008	ඩබ්ලිව්.එම්.ජයන්ත මයා	(ශ්‍රීපාලි)	රු.200,000/-
2009	ආර්.එම්.යූ.උඩගෙදර	(කැලණිය)	රු.1,500,000/-
2010	වී.වාසු මිය	(කොළඹ)	රු.750,000/-

2.16 සංසන්දනාත්මක සංඛ්‍යා

සංසන්දනාත්මක සංඛ්‍යා අවශ්‍ය පරිදි වත්මන් ඉදිරිපත් කිරීමට අනුකූලවීමට යළිසකස් කර ඇත-.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

NCAS

2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	12/31/2017	12/31/2016
		රු.	රු.
පුනරාවර්තන ප්‍රදාන	**1**		
පුද්ගල පඩිනඩි		11,600,000.00	10,800,000.00
වෙනත් පුනරාවර්තන		5,400,000.00	5,800,000.00
		17,000,000.00	**16,600,000.00**
ප්‍රාග්ධන ප්‍රදාන	**2**		
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම		-	183,870.19
ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම		-	-
		-	**183,870.19**
ක්‍රමක්ෂය කළ ප්‍රාග්ධන ප්‍රදාන	**3**		
ගොඩනැගිලි හා ආකෘති		1,569,058.34	1,569,058.34
යන්ත්‍ර සූත්‍ර හා කාර්යාල උපකරණ		687,558.82	452,414.71
පරිගණක හා මෘදුකාංග		1,405,889.22	1,213,979.26
ගෘහභාණ්ඩ හා සවිකිරීම්		189,566.48	253,377.67
පොත් හා වාර සඟරා		16,916.92	30,363.06
		3,868,989.78	**3,519,193.04**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

NCAS

සටහන : 4

	12/31/2017			12/31/2016		
සැලසුම් කළ පාඨමාලා හා වැඩමුළු වියදම්	ආදායම් රු.	වියදම් රු.	ශුද්ධ ආදායම් රු.	ආදායම් රු.	වියදම් රු.	ශුද්ධ ආදායම් රු.
පර්යේෂණ යෝජනා ගොඩනැගීම පිළිබඳ වැඩ	-	-	-	21,000.00	17,273.00	3,727.00
පොදු ප්‍රසම්පාදන වැඩමුළුව	-	-	-	-	-	-
IFRS වැඩමුළුව	-	-	-	-	-	-
SPSS පාඨමාලාව	1,122,000.00	926,629.00	195,371.00	850,000.00	687,220.25	162,779.75
IELTS පාඨමාලාව	-	-	-	-	-	-
RMTS පාඨමාලාව	-	-	-	-	-	-
Excel උසස් පාඨමාලාව	322,000.00	211,856.50	110,143.50	266,000.00	186,771.50	79,228.50
Access උසස් පාඨමාලාව	-	-	-	104,000.00	85,128.00	18,872.00
Office උසස් පාඨමාලාව	-	-	-	-	-	-
AMOS වැඩමුළුව	330,000.00	273,927.00	56,073.00	428,000.00	348,101.10	79,898.90
PPS & WS වැඩමුළුව	-	-	-	144,000.00	120,888.00	23,112.00
Eview වැඩමුළුව	-	-	-	317,000.00	215,751.25	101,248.75
Nvivo වැඩමුළුව	5,000.00	-	5,000.00	340,000.00	271,376.25	68,623.75
Bus. & Adv. Wrt. වැඩමුළුව	240,000.00	125,907.00	114,093.00	392,000.00	233,830.00	158,170.00
අධ්‍යයන රචනය	198,000.00	131,249.00	66,751.00			
SSRM පාඨමාලාව	-	-	-	256,750.00	242,376.50	14,373.50
	2,217,000.00	1,669,568.50	**547,431.50**	3,118,750.00	2,408,715.85	**710,034.15**

2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	12/31/2017	12/31/2016
		රු.	රු.
වෙනත් ආදායම්	5		
සැකසූ පාඨමාලා ආදායම		-	-
ඉල්ලුම් පත්‍ර සැකසුම් හා වැඩමුළු ආදායම		64,000.00	63,000.00
පර්යේෂණ පරිසංවාද ආදායම්		96,000.00	49,000.00
බැහැරකිරීම් හා වෙනත්		57,192.80	43,336.22
සුබසාධක ආදායම		3,325.00	3,425.00
පොලී ආදායම් - FD		2,491,159.56	68,924.99
පොලී ආදායම් - IFRS		96,131.73	88,606.88
		2,807,809.09	**316,293.09**
පුද්ගල පඩිනඩි	6		
වැටුප් හා වේතන		5,416,887.99	4,376,916.00
අර්ථ සාධක අරමුදල		592,011.02	451,477.70
විශ්‍රාම ප්‍රතිලාභ		476,613.35	373,553.97
සේ.හා.අ.		213,546.47	165,006.37
ශාස්ත්‍රීය දීමනා		959,068.35	782,871.20
විශේෂ දීමනා			706,519.52
වෙනත් දීමනා		942,020.66	538,961.52
ජීවන වියදම් දීමනාව		1,047,967.74	1,123,200.00
අතිකාල		119,387.54	2,708.70
පර්යේෂණ දීමනා		166,859.00	311,902.50
අමතර දීමනා		686,944.58	704,776.52
අන්තර් දීමනා			1,320,000.00
නිවාඩු පඩි			1,848.00
වන්දි දීමනා		791,285.72	124,902.00
විශ්‍රාම ප්‍රතිලාභ		109,389.18	184,365.65
කාර්ය මණ්ඩල ගාස්තු - IFRS ගැලපුම්		96,131.73	88,606.88
		11,618,113.33	**11,257,616.53**
ගමන් වියදම්	7		
ගමන් වියදම් - දේශීය		1,820.00	-
		1,820.00	**-**
සැපයුම්	8		
ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා		228,188.76	234,262.46
ඉන්ධන හා ලිහිසි තෙල්		123,749.00	80,209.00
නිල ඇඳුම් හා මැහුම් කුලී			7,671.00
වෙනත් සැපයුම්		362.00	14,896.50
		352,299.76	**337,038.96**
නඩත්තු වියදම්	9		
වාහන		-	-
යන්ත්‍රෝපකරණ හා කාර්යාල උපකරණ		1,452,645.42	742,530.49
ගොඩනැගිලි හා ඉදිකිරීම්		29,905.00	-
වෙනත්		2,500.00	43,420.00
		1,485,050.42	**785,950.49**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

NCAS

2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	12/31/2017 රු.	12/31/2016 රු.
ගිවිසුම්ගත සේවා	**10**		
ප්‍රවාහන		5,650.00	29,183.00
විදුලි සංදේශ		643,492.25	685,680.03
තැපැල් ගාස්තු		34,435.00	32,040.00
විදුලිය		559,412.46	603,594.20
ආරක්ෂක සේවා		709,266.18	561,946.16
ජලය		38,779.49	24,055.93
පිරිසිදු කිරීම් සේවා		312,785.51	213,950.00
කුලී හා හයර් ගාස්තු		1,260,090.00	586,800.00
ප්‍රාදේශීය අධිකාරී වරිපනම් හා බදු		196,311.50	153,615.00
මුද්‍රණ, ප්‍රචාරණ ආදිය		168,750.00	332,400.00
වෙනත්		30,080.00	29,470.00
		3,959,052.39	**3,252,734.32**
වෙනත් පුනරාවර්තන	**11**		
කාර්ය මණ්ඩල දියුණු කිරීම්		61,265.32	60,500.00
නිවාඩු බලපත්‍ර, වාහන ප්‍රවේශ පත්‍ර		8,400.00	27,400.00
විශේෂ සේවා - විධායක සභා හා කමිටු		682,563.50	806,305.00
වැඩමුළු, සම්මන්ත්‍රණ		141,169.50	13,075.00
පර්යේෂණ හා ප්‍රකාශන			-
බැංකු ගාස්තු		2,000.00	2,000.00
දායකත්ව හා සාමාජික මුදල්			27,363.54
සේවක සුබසාධනය		13,705.00	9,779.00
වෙනත්		195,818.11	865,241.91
E – ජර්නල් සඳහා වාර්ෂික දායකත්වය			-
සාද වියදම්			-
දේපල ණය පොලී මුදල්		233,855.78	253,210.71
සැලසුම් කළ පාඨමාලා වියදම්			-
		1,338,777.21	**2,064,875.16**
වියදම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	**12**		
ගොඩනැගිලි හා ඉදිකිරීම්		-	183,870.19
යන්ත්‍රෝපකරණ හා කාර්යාල උපකරණ		-	93,733.05
		-	**277,603.24**
ක්ෂයවීම්	**13**		
ගොඩනැගිලි හා ඉදිකිරීම්		1,569,058.34	1,569,058.34
කාර්යාල උපකරණ		687,558.82	452,414.71
පරිගණක හා මෘදුකාංග		1,405,889.22	1,213,979.26
ගෘහභාණ්ඩ හා සවිකිරීම්		189,566.48	253,377.67
පොත් හා වාර සඟරා		16,916.92	30,363.06
		3,868,989.78	**3,519,193.04**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

NCAS

සටහන : 14

දේපළ,යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	**17/01/01 දිනට ශේෂය**	**එකතු කිරීම්**	**ගැලපුම්**	**බැහැර කිරීම්**	**17/12/31 දිනට ශේෂය**
අගය	**රු.**	**රු.**	**රු.**	**රු.**	**රු.**
ඉඩම් හා දියුණුකිරීම්	40,793,418.00	-		-	40,793,418.00
NCAS ගොඩනැගිල්ල	31,381,166.78	-		-	31,381,166.78
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	3,113,139.99	31,905.00		-	3,145,044.99
යන්ත්‍රෝපකරණ හා කාර්යාල උපකරණ	5,749,760.81	179,880.00		-	5,929,640.81
පරිගණක හා මෘදුකාංග	14,335,778.83	1,922,349.79		-	16,258,128.62
පුස්තකාල පොත් සහ වාර සඟරා	277,230.32	-		-	277,230.32
	95,650,494.73	**2,134,134.79**		**-**	**97,784,629.52**

	17/01/01 දිනට ශේෂය	**වර්ෂය සඳහා අයකිරීම්**		**බැහැර කිරීම්**	**17/12/31 දිනට ශේෂය**
ක්ෂයවීම්	**රු.**	**රු.**		**රු.**	**රු.**
ඉඩම් හා දියුණුකිරීම්	-	-		-	-
NCAS ගොඩනැගිල්ල	17,156,833.80	1,569,058.34		-	18,725,892.14
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	2,323,831.78	189,566.48		-	2,513,398.26
යන්ත්‍රෝපකරණ හා කාර්යාල උපකරණ	3,269,578.11	687,558.82		-	3,957,136.93
පරිගනක හා මෘදුකාංග	10,191,474.75	1,405,889.22		-	11,597,363.97
පුස්තකාල පොත් සහ වාර සඟරා	252,448.06	16,916.92		-	269,364.98
	33,194,166.50	**3,868,989.78**		**-**	**37,063,156.28**
ලියා හල අගය	**62,456,328.23**				**60,721,473.24**

සටහන : HETC ව්‍යාපෘතියෙන් පවරාදෙන ලද ස්ථාවර වත්කම්වල අගය උපයෝගීතාව අනුව තක්සේරු කර ඇති අතර 2016 දෙසැම්බර් 31 වන විට NCAS හි ස්ථාවර වත්කම්වලට ඇතුළත් කර ඇත. වත්කම්වල ඇස්තමේන්තු වටිනාකම පහත දැක්වේ.

පරිගනක හා මෘදුකාංග	රු.. 1,102,000
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	රු. 6,400
කාර්යාල උපකරණ	රු. 2,000

2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	12/31/2016 රු.	12/31/2015 රු.
භාණ්ඩ ලේඛන	**15**		
ලිපි ද්‍රව්‍ය		218,639.00	212,326.90
මුද්‍රිත ලේඛන		52,521.70	70,000.06
වෙනත්		-	-
		271,160.70	**282,326.96**
ලැබිය යුතු, තැන්පතු, අත්තිකාරම් හා පෙර ගෙවුම්	**16**		
ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය		2,500.00	2,500.00
කාර්ය මණ්ඩල ණය		1,294,458.08	1,135,985.70
IFRS ගැලපුම් - කාර්ය මණ්ඩල ණය		(298,288.97)	(131,759.54)
Advance -විශේෂ		-	2,800.00
අත්තිකාරම් - උත්සව		1,250.00	-
AMOS ආදායම් පාලනය		600.00	-
Excel Adv ආදායම් පාලනය		7,000.00	-
EVIEWS ආදායම් පාලනය		-	30,000.00
කාර්ය මණ්ඩලය සඳහා පෙර ගෙවුම් ආධාර		298,288.97	131,759.54
		1,305,808.08	**1,171,285.70**
මුදල් හා මුදල් සමාන දෑ	**17**		
බැංකු ජංගම ගිණුම් අංක 3532126		24,327,670.74	63,405,734.43
ස්ථාවර තැන්පතු		25,165,000.00	845,000.00
		49,492,670.74	**64,250,734.43**
උපචිත අරමුදල	**18**		
ඉහතින් ගෙනා ශේෂය ජනවාරි 01 වැනි දිනට		2,233,802.63	2,022,579.64
		(2,216,099.88)	
ආදායම් හා වියදම් ප්‍රකාශයේ අතිරික්තය/හිඟය		1,237,687.92	211,222.99
පූර්ව වර්ෂ ගැලපුම			-
ඉදිරියට ගෙන ගිය ශේෂය දෙසැම්බර් 31 දිනට		**1,255,390.67**	**2,233,802.63**
වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	**19**		
පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්		87,740.46	87,740.46
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම		-	-
දැනුම් ප්‍රචාලනය		694,108.00	694,108.00
පර්යේෂණ පරිසංවාද		1,365,728.99	850,779.41
PhD / Mphill ප්‍රදාන		6,365,661.15	6,365,661.15
		8,513,238.60	**7,998,289.02**

2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	12/31/2016 රු.	12/31/2015 රු.
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්	**20**		
විශ්‍රාම බැඳීම් -			
ජනවාරි 01 දිනට ශේෂය		1,222,838.65	1,038,473.00
වර්ෂය සඳහා අයකිරීම්		109,389.18	184,365.65
		1,332,227.83	1,222,838.65
වර්ෂය තුළ කරන ලද වියදම්		-	-
පූර්ව වර්ෂ ගැලපුම්		-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය		**1,332,227.83**	**1,222,838.65**
උපචිත වියදම්	**21**		
ආරක්ෂක ගාස්තු		68,362.44	48,726.42
වැටුප් හා වේතන		112,560.76	56,440.57
දුරකථන ගාස්තු		51,544.72	58,663.80
පිරිසිදු කිරීමේ සේවාවන්		25,072.88	24,046.50
වාහන කුලී පදනම් ගාස්තු		105,300.00	117,000.00
නඩත්තු කිරීම් - යන්ත්‍රෝපකරණ හා උපකරණ		-	20,125.00
දේපල ණය පොලී මුදල් - අඩු කිරීම		6,478.15	25,111.46
පුවත්පත් ගාස්තු		5,540.00	2,700.00
විනෝද උත්සව වියදම්			-
		374,858.95	**352,813.75**
ගෙවිය යුතු	**22**		
නොගෙවූ වේතන		0.05	0.05
මුද්දර ගාස්තු		1,170.00	1,860.00
කොන්ත්‍රාත්කරුවන්		47,014.61	160,580.71
PhD Mphil ප්‍රදාන		35,421,104.92	49,695,224.00
UEOA ගෙවිය යුතු		-	200.00
Excel Adv ආදායම් පාලනය		25,000.00	-
විශ්‍රාම වැටුප්		34,325.36	-
බදු ගෙවීම්		29,713.20	45,402.15
වෙනත්		335,649.75	342,472.80
		35,893,977.89	**50,245,739.71**

තත්‍ය වියදම් හා ඇස්තමේන්තු වියදම් අතර සංසන්දනාත්මක ප්‍රකාශය
2017 දෙසැම්බර් **31** වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

	තත්‍ය වියදම්	ඇස්තමේන්තු වියදම්
පුද්ගල වේතන	11,618,113.33	14,000,000.00
වෙනත් පුනරාවර්තන	7,136,999.78	7,000,000.00
දැනුම් ඉහල නැංවීම හා ආයතනික සංවර්ධනය		
PhD Mphil ප්‍රදාන අරමුදල	59,977,493.16	111,940,000.00
දැනුම් ප්‍රචාලන ප්‍රදාන අරමුදල	120,000.00	1,800,000.00
වෙනත්		
පර්යේෂණ පරිසංවාදය	1,403,355.19	1,500,000.00
	80,255,961.46	**136,240,000.00**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ඒ/එන්සිඒඑස්/6/17/02

මගේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 02 දින

අධ්‍යක්ෂ

මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 වගන්තිය සහ 2005 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා නියමාවලියේ 26 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම් මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණන විෂය පථය හා ප්‍රමාණය තීරණ කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන පාඨමාලා තුළින් උපයනු ලබන ආදායම් ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 ප්‍රකාරව ගිණුම් සටහන් මඟින් හෙළිදරවු කර නොතිබූ අතර ඒ අනුව පෙර වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.132,000 ක් වූ පාඨමාලා ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් තබා තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රදානලාභීන්ගෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබූ රු.643,528 ක් වූ මුදලින් රු.193,518 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණ ද එය PhD/mphil Grants Receivable ගිණුමට ගැලපුම් නොකර සමාලෝචිත වර්ෂයට අදාල PhD රාජ්‍ය ප්‍රදාන ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2011 සහ 2014 වර්ෂවල මිලදී ගෙන තිබූ පිළිවෙළින් රු.72,500 ක් සහ රු.140,000 ක් වූ වායු සමීකරණ යන්ත්‍ර 02 ක වටිනාකම එම වර්ෂවල ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට පුනරුත්ථාපන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා ජංගම නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. තවද ස්ථාවර වත්කම් ලේඛනයට එම වත්කම් ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.2,649,084 ක් වූ භාණ්ඩාගාර ප්‍රදාන ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ රු.450,374 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මූල්‍ය ක්‍රියාකාරකම් රු.2,198,710 ක් අඩුවෙන් දක්වා තිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

2005 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා නියමාවලියේ 16 (1) වගන්තිය අනුව මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා පූර්ණකාලීන කටයුතු කළ යුතු නිලධාරියෙකු විය යුතු වුවද 2011 වර්ෂයේ සිට විගණිත දින වූ 2018 ජූනි 30 දින දක්වාම එම තනතුර සඳහා පූර්ණ කාලීනව අධ්‍යක්ෂවරයෙකු පත්කර නොතිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු රු.මිලියන 15 ක සහ රු.මිලියන 10 ක මුදල් පිළිවෙලින් සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 3 දින සහ ජූනි 29 දිනයන්හි ආපසු ලබා ගෙන තිබුණ ද ඒ සඳහා "රිජන්ට් කවුන්සිලයේ" අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,237,687 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 211,222 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,026,465 ක වර්ධනය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ස්ථාවර තැන්පතු පොලී ආදායමරු.2,429,760 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.166,709 ක් වූ අතිරික්තය සමාලෝචිත වර්ෂය වනවිට විචලනයක් සහිතව රු.1,237,687 ක් දක්වා වර්ධනය වී තිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.10,027,236 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු.16,724,789 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 සැලසුම් කිරීම

මධ්‍යස්ථානය වෙනුවෙන් පිළියෙළ කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුළ අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රජය මුදල් චක්‍රලේඛ උපදෙස් අනුව ඇතුළත් කළ යුතු පහත කරුණු ඇතුළත් කර නොතිබුණි.

(අ) අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යමණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්යමණ්ඩල විස්තර

(ආ) අදාළ වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතාවය අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම, ක්‍රියාත්මක කාල රාමුව

4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

(අ) 2017 වර්ෂයට අදාළව පිළියෙළ කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රධාන ඉලක්ක හා උප අරමුණු ළඟාකර ගැනීමට යොදාගෙන තිබූ උපාය මාර්ග හා ක්‍රියාකාරකම්වල කාර්යසාධනයට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පශ්චාත් උපාධි පාඨමාලා සඳහා දැනටමත් ප්‍රදාන ලබාගෙන අධ්‍යයන කටයුතු කර ගෙන යනු ලබන ප්‍රතිලාභීන් 50 දෙනෙකු වෙත මූල්‍ය පහසුකම් සැපයීමට රු.මිලියන 60 ක් වෙන්කර තිබුණ ද එයින් උපයෝජනය කර පැවතියේ ප්‍රතිලාභීන් 41 දෙනෙකු සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට රු.මිලියන 35 ක් පමණි.

(ii) විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 80 දෙනෙකු සඳහා ප්‍රදාන ලබාදීමට රු.මිලියන 30 ක් වෙන්කර තිබුණ ද එයින් උපයෝජනය කර පැවතියේ කාර්ය මණ්ඩලයේ 21 දෙනෙකු වෙනුවෙන් ප්‍රදාන ලබාදීම සඳහා රු.මිලියන 15 ක් පමණි.

(iii) පරීක්ෂණ කටයුතු සඳහා විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය දිරිමත් කිරීමේ අරමුණින් පාඨමාලා 13 ක් පවත්වා සාමාජිකයින් 300 දෙනෙකු පුහුණු කිරීමට සැලසුම් කර තිබුණ ද පාඨමාලා 08 ක් පවත්වා සාමාජිකයින් 107 දෙනෙකු පුහුණු කිරීම පමණක් සිදුකර තිබුණි.

(iv) විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 40 දෙනෙකු වෙනුවෙන් පරීක්ෂණ කටයුතු සඳහා වැදගත්වන දේශන සංවිධානය කිරීම සහ පරීක්ෂණ දිරිමත්වන අයුරින් පරීක්ෂණ සොයා ගැනීම් ප්‍රසිද්ධ කිරීම යටතේ වූ ක්‍රියාකාරකම් 02 ක් සිදු කිරීමට රු.මිලියන 0.1 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මෙහි පළමු ක්‍රියාකාරකම යටතේ වූ ආරාධිත දේශන පැවැත්වීම සහ ජර්නල් 02 ක් මුද්‍රණය කිරීම යන කාර්යයන් ඉටු කර නොතිබුණි. එසේම දෙවන ක්‍රියාකාරකමට අදාළව පරීක්ෂණ සම්මන්ත්‍රණයට ඉදිරිපත් කිරීමට උපුටන 200 ක් (Abstract) ඇතුළත් කිරීමට සැලසුම් කර පැවතියද සමාලෝචනය කර මුද්‍රණය කර පැවතියේ උපුටන 48 ක් පමණි.

(v) පරීක්ෂකයන්ගේ දැනීම වැඩිදියුණු කිරීමේ අරමුණින් පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ මධ්‍යගත දත්ත ගබඩා ක්‍රමයක් ඇති කිරීමට රු.මිලියන 3.5 ක් වෙන්කර පැවතියද අදාළ කාර්යය ඉටුකර නොතිබුණි.

(vi) Excel/Access වැඩමුළුව වෙනුවෙන් රු.මිලියන 0.32 ක් වෙන්කර එම මුදලින් 120 දෙනෙකුගේ සහභාගීත්වය මත වැඩසටහන් 05 ක් පැවැත්වීමට සැලසුම් කර පැවතිය ද රු.මිලියන 0.21 ක් වැයකර වැඩසටහන් 02 ක් පමණක් පවත්වා තිබූ අතර ඒ සඳහා සහභාගීත්වය 46 දෙනෙකු පමණක් විය.

(ආ) දර්ශනශූරී හා දර්ශනපති උපාධි ප්‍රදාන ලබාදීමේ කාර්යසාධනයට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා දර්ශනශූරී හා දර්ශනපති උපාධි සඳහා පිරිනමන ලද ප්‍රදානලාභීන් සංඛ්‍යාව 60 සිට 46 දක්වා වූ පරාසයක පැවතියද 2014 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂය අවසාන වන විට ප්‍රදාන ලබාදී ඇති ප්‍රදානලාභීන් සංඛ්‍යාව 46 සිට 15 දක්වා පහළ අගයක් ගෙන තිබුණි.

(ii) 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ආයතනය විසින් PhD & Mphil උපාධි සඳහා ප්‍රදාන ලබාදී තිබූ ප්‍රදානලාභීන් 38 දෙනෙකුගේ උපාධි කටයුතු 2016 වර්ෂය අවසාන වන විට නිම කල යුතු වුවද 2017 වර්ෂය අවසන් වන විටත් ඔවුන්ගේ උපාධි කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. ඒ සඳහා ඔවුන් වෙත ප්‍රදානය කර තිබූ ප්‍රදානයන්ගේ වටිනාකම රු.34,317,407 ක් විය.

(iii) 2006 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා මධ්‍යස්ථානය විසින් ප්‍රධානලාභීන් වෙත ලබාදී තිබූ ප්‍රදාන, වලින් උපාධි කටයුතු නිසිපරිදි කරගෙන නොයාම මත අවලංගු කර තිබූ ප්‍රදාන ලාභීන් 04 දෙනෙකුගෙන් මධ්‍යස්ථානයට අයවියයුතු මුදල රු.4,380,044 ක් විය.

4.2 අරමුදල් ඌන උපයෝජනය

වැඩසටහන් 03 ක් සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් 2015 සිට 2017 කාල පරාසය තුල ලබාදී තිබූ එකතුව රු.7,147,509 ක ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතනවල වැඩිවීම රු. 1,395,039 ක් හෙවත් සියයට 35 ක් වී තිබූ අතර අතිකාල ඇතුළු අනිකුත් දීමනාවල වැඩිවීම රු. 3,176,185 ක් හෙවත් සියයට 105 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු සේවක පිරිවැය 2013 වර්ෂයට සාපේක්ෂව රු. 4,571,224 කින් හෙවත් සියයට 65 කින් වැඩිවී තිබූ අතර ඒක පුද්ගල සේවක පිරිවැයෙහි වැඩිවීම 2013 වර්ෂයට සාපේක්ෂව රු464,827 ක් හෙවත් සියයට 92 ක් විය.

(ඇ) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වාර්ෂික වැටුප් හා වේතනවල වටිනාකම අතිකාල හා අනෙකුත් දීමනාවලට දක්වන ප්‍රතිශතය 2013 සිට 2017 දක්වා පිළිවෙළින් සියයට 75 ක, 102 ක, 165 ක,157 ක හා 114 ක ඉහළ ප්‍රතිශතයක් විය.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 අගෝස්තු 14 දිනැති හා අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශ ලේකම් විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛ ලිපිය සහ තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයන් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

(ආ) ඉහත පරිදි වසර '2030 න්‍යාය පත්‍රය' පිළිබඳ මධ්‍යස්ථානය දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වියයුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍රය	නිරීක්ෂණ
(අ) ප්‍රදාන හා පාඨමාලා සම්බන්ධ අභ්‍යන්තර පාලනය	ප්‍රදාන ලබාදී ඇති ප්‍රදානලාභීන්ගේ උපාධි කටයුතු නියමිත කාල වකවානු ඇතුළත සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කිරීම සහ ඒ අනුව කටයුතු නොකරන ප්‍රදාන ලාභීන් වෙත ලබාදී ඇති ප්‍රදාන නැවත අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම.

(ආ) සැලසුම් කිරීම

ක්‍රියාකාරී සැලැස්මේ අපගමනයන් අවම කර අදාළ ඉලක්ක කරා ළඟාවිය හැකි අයුරින් කටයුතු කර නොතිබීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති